# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1720/7 — 2011 අගෝස්තු 24 වැනි බදාදා - 2011.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය විජේසිංහ හෙට්ටිඅච්චි මුදියන්සේලාගේ අතුල සරත් කුමාර විජේසිංහ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වූ පහත සඳහන් කරුණු/චෝදනා හේතුකොට ගෙන මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා විසින් සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී පනතේ 185 වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදුකර තිබේ ද යන්න පරීක්ෂා කර මාස 03ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවක් වශයෙන් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මහතා පත් කරමි.

**පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා**

*චෝදනා :*

I. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.06.23 දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව වවුචර් පත්‍ර 624 මගින් කොළඹ 11, මැලිබන් විදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් 46,275ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදක් සිදු කිරීම

II. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2011.07.26 හෝ ඊට අසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සහකාර/වැඩ බලන ලේකම් අයි. එම්. ස්වර්ණතිලකා යන අයගේ රාජකාරියට බාධා වන පරිදි ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1) (ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදුකිරීම

1A - PG 001282— 340 (2011/08)

III. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් කටයුතු කරමින් 2011.07.26 දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සහකාර/වැඩ බලන ලේකම් අයි. එම්. ස්වර්ණතිලකා යන අයට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(i) වගන්තිය යටතට ගැනෙන මූල්‍ය සම්බන්ධතාවක් වෙනුවෙන් ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් කිරීමට පූර්ව අවශ්‍යතා සම්පූර්ණ නොකර තිබිය දී විධානය කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

IV. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් කටයුතු කරමින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා විදුලි බන්ඩල් කේබල් 100ක් සැපයීම වෙනුවෙන් සංඝරාජ මාවත, කොළඹ 10, කොලෝනියල් ඉලෙක්ට්‍රිකල් ඉක්විප්මන්ට් ආයතනයෙන් රුපියල් 29,500ක බිල් පතක් මහව ප්‍රාදේශීය සභාවේ සභාපති නමට ඉදිරිපත් කර තිබියදී ''කොලෝනියල් ඉලෙක්ට්‍රිකල් ඉක්විප්මන්ට්'' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් සිදු නොකර මහව ප්‍රාදේශීය සභාවේ රියදුරු කේ. එම්. අරුණ පුෂ්ප කුමාර යන අයට 2011.04.26 දින හෝ ඊට ආසන්න දිනයක දී වවුචර් අංක 436 මගින් රුපියල් 29,500ක මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(1) වගන්තියට යටතට ගැනෙන මූල්‍ය සම්බන්ධතාවක් වෙනුවෙන් ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

V, 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.07.13 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා විධිමත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව වීථි පහන් උපකරණ සැපයීම සඳහා කොළඹ 11, මැලිබන් වීදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට රුපියල් 143,850ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වැනි වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදුකිරීම.

VI. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 2011.07.13 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව වවුචර් පත්‍ර අංක 741, 742, 743 සහ 744 මගින් කොළඹ 11, මැලිබන් වීදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් 143,850ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

තව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම පරීක්ෂණය සඳහා විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මැතිතුමා වෙත හිමිවන අතර මෙම පත්කිරීමේ දින සිට තුන් මසක කාලයක් ඇතුළත පරීක්ෂණය සිදු කර, පරීක්ෂණ වල නිගමන ඇතුළත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කළ යුතු බව ද දන්වනු කැමැත්තෙමි.

ඉහත කරුණු පරීක්ෂා කිරීමේදී අදාල කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන හා
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
ඉඩම් ප්‍රවාහන, පරිසර, සංචාරක ආයෝජන, සම්බන්ධීකරණ,
සමූපකාර සංවර්ධන හා ආහාර සැපයුම් විෂයභාර අමාත්‍ය.

2011 අගෝස්තු මස 23 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

(අ) *වාචික සාක්ෂි*

i. ගබඩා භාරකරු ඩී. එම්. භාග්‍යා මධුභානි දිසානායක මිය., ප්‍රාදේශීය සභාව, මහව
ii. විදුලි කාර්මික ආර්. එම්. සෙනරත් බණ්ඩාර මයා, ප්‍රාදේශීය සභාව, මහව
iii. ප්‍රාදේශීය ලේකම්, ආර්. එම්. වන්නිනායක මහතා, (2011.01.06 දින සිට 2011.04.01 දින ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරී ලෙස කටයුතු කළ), ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහව
iv. කළමණාකරන සහකාර අයි. එම්. ස්වර්ණතිලකා මිය, ප්‍රාදේශීය සභාව, මහව
v. පළාත් පාලන නිලධාරී මුල්‍ය, කල්‍යාණි සමන්ලතා මිය, ප්‍රාදේශීය සභාව, මහව
vi. පළාත් පාලන නිලධාරී මුල්‍ය, එන්. ආර්. ඒ. පී. වන්නිනායක මිය, ප්‍රාදේශීය සභාව, මහව
vii. පරිපාලන නිලධාරි ඩබ්. තන්තිරිගම මහතා, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කුරුණෑගල
viii. කළමණාකරන සහකාර එච්. විජේතුංග මිය, ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම
ix. ප්‍රධාන කළමණාකරන සහකාර ආර්. එම්. රත්නායක මැණිකේ මිය, පළාත් පාලන දෙපාර්තමේන්තුව, කුරුණෑගල
x. මාර්ග කම්කරු ඩී. එම්. දිසානායක මයා, ප්‍රාදේශීය සභාව, මහව
xi. වැඩබලන ලේකම්, වයි. එම්. සේනානායක මහතා, ප්‍රාදේශීය සභාව, මහව
xii. ජේ. ඒ. පියසේන මයා, මාර්ග කම්කරු, ප්‍රාදේශීය සභාව, මහව
xiii. ස්ථානාධිපති, පොලිස් ස්ථානය, මහව
xiv. දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී, දිසා රෝහල, මහව
xv. අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කුරුණෑගල
xvi. ඩබ්. පී. බී. තිලකරත්න මයා, වැඩ සටහන් සහකාර, (ආදායම් ප්‍රවර්ධන), ප්‍රාදේශීය සභාව, මහව
xvii. ආර්. අයි. බී. එස්. බී. රත්නමලල මයා, කළමණාකරන සහකාර, ප්‍රාදේශීය සභාව, මහව
xviii. ආර්. එම්. රත්නායක මයා, ආදේශක ආදායම් පරිපාලක, ප්‍රාදේශීය සභාව, මහව
xix. රියදුරු කේ. එම්. අරුණ පුෂ්ප කුමාර මයා, ප්‍රාදේශීය සභාව, මහව
xx. කළමණාකරු, මහජන බැංකුව, මහව

(ආ) *ලිඛිත සාක්ෂි* :

i. 2011.03.01 දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව
ii. 2011.01.27 දින බලයලත් නිලධාරීගේ ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීමේ ලිපිය
iii. 2011.03.15 දින ම/ප්‍රා/ස/2/1/පොදු ඇනවුම
iv. 2011.04.28 දින ම/ප්‍රා/ස/2/1 පොදු ඇනවුම
v. මහව ප්‍රාදේශීය සභාවේ බස් නැවතුම්පල ඉදිකිරීමේ II හා III අදියර ඉදි කිරීමේ ලිපි ගොනු
vi. මහව ප්‍රාදේශීය සභාවේ ගල් වැලි බොරලු ලේඛනය
vii. වීථි පහන් උපකරණ ගබඩා ලැබීම් සටහන් පොත (2051 සිට 2100 දක්වා)
viii. වීථි පහන් උපකරණ නිකුත් කිරීමේ නියෝග පොත (2351 සිට 2400 දක්වා)
ix. මහව බස් නැවතුම්පල සඳහා මහව ප්‍රාදේශීය සභාව වෙත මහව මහේස්ත්‍රාත් උසාවියෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති නමට වැලි නිකුත් කළ මහව ම. උ/වැලි (රාජසන්තක කරන ලද) ලිපිය හා ම. දි. අ. නඩු භාණ්ඩ ලිපිය.
x. මහම ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සහකාර වැඩ බලන ලද ලේකම් අයි. එම්. ස්වර්ණතිලකා මහත්මියගේ ප්‍රකාශය
xi. 2011.07.26 දින මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමණාකරන සහකාර ආර්. එම්. රත්නායක මහත්මියට ලබා දුන් දුරකථන ඇමතුම සටහන්ව තැබූ ලිපිය.
xii. 2011.06.23 දිනැති 624 වන වවුචරය හා ඊට අදාළ ඇමුණුම
xiii. 2011 වීථි පහන් උපකරණ ලිපි ගොනුව
xiv. 2011.07.13 දිනැති අංක 741, 742, 743, 744 දරන ගෙවීම් වවුචර් හා ඊට අදාළ ඇමුණුම්
xv. 2011.07.13 දිනැති අංක 741, 742, 743, 744 දරන ගෙවීම් වවුචර් සඳහා මහව ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරන ලද 019838 දරන චෙක්පතේ පිටපත.
xvi. 2011.07.27 දින අයි. එම්. ස්වර්ණතිලකා මහත්මියගේ රාජකාරියට බාධා කිරීම සම්බන්ධව දෙපාර්තමේන්තු පරීක්ෂණයට අදාළ කට උත්තර හා වාර්තා
xvii. 2011.04.26 දින වවුචර් අංක 436 හා ඊට අදාළ ඇමුණුම
xviii. ''කොලෝනියල් ඉලෙක්ට්‍රිකල් ඉක්විප්මන්ට්'' ආයතනයේ රුපියල් 29,500ක දින රහිත බිල් පත.
xix. අංක 012951 දරන චෙක් පතේ ඡායාස්ථ පිටපත හා එම චෙක් පතේ පිලිපත
xx. බලයලත් නිලධාරීන් පත්කිරීම සම්බන්ධ 2011.01.06 දිනැති හා අංක 1687/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිවිශේෂ) ගැසට් පත්‍රය.

09-217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.